# ජාතික ව්‍යාපාරයේ අද කාර්‍යභාරය

ජාතික හෙළ උරුමය කැඩී බිඳී යෑම පිළිබඳ සතුටුවන්නෝ වෙති. තුට්ටු දෙකේ නූතනවාදී මත මෙන් ම තුට්ටු බාගයක්වත් නොවටිනා පශ්චාත්නූතනවාදී මත කරපින්නාගත් අද බාලයෝ ඒ අතර වෙති. ඔවුන් ජාතික හෙළ උරුමය කැඩීයෑම පිළිබඳ ව ප්‍රීතියට පත්වී ඇත්තේ ඒ සමග ජාතික ව්‍යාපාරය ද බිඳ වැටී ඇත යන මතයේ පිහිටමින් ය. මේ නූතනවාදී මැඩියන් මෙන් ම පශ්චාත්නූතනවාදී මැඩියන් ද නොදන්නා දේ බොහෝ ය. ඉන් පළමුවැන්න නම් නූතනත්වය හා එහි බිහිවන නූතනවාදී හා පශ්චාත්නූතනවාදී මතවාද, ප්‍රවාද (මේවා අතර වෙනසක් නැත. සෑම ප්‍රවාදයක් ම මතවාදයක් වෙයි.) අවසාන වශයෙන් සේවය කරන්නේ ක්‍රිස්තියානියට බව ය. අපි මේ පිළිබඳ පසුව වැඩිදුරටත් කතාකරමු. මේ අද බාල බටහිර වතුර ටැංකිවල ඉබාගතේ යන ඉස්ගෙඩියන්ට හා මැඩියන්ට අඩුම තරමේ ඉස්ගෙඩියකුගේ තරමකවත් හිසක් තිබුණි නම් අපේ ප්‍රවාද නමින් විදුසර පුවත්පතේ පළවන ලිපි කියවා බටහිර දැනුම ක්‍රිස්තියානියට සේවය කරන්නේ කෙසේ දැයි දැනගැනීමට තිබුණි. එහෙත් එවැනි හිසක් හෝ නැති ඔවුන් දැනුවත් කිරීම අපට තබා සුරගුරුටවත් කළ හැක්කක් නො වෙයි.

ජාතික හෙළ උරුමය බිහිවීමට ආසන්න කාලයේ සිට ම ඒ ගැන මා තරම් විවේචනය කළ වෙනත් අයකු නැතැයි සිතමි. එමෙන් ම ජාතික හෙළ උරුමයට සිදුවන්නේ කුමක් ද යන්න පිළිබඳව ද අපට කල්තබා ම ප්‍රකාශකළ හැකි විය. අපේ අනාවැකි අද ඉටු වී ඇත. ඒ ගැන අපට ඇත්තේ සතුටක් නො වෙයි. එමෙන් ම ඒ පිළිබඳ කණගාටුවක් ද අපට නැත. අප යන්නේ කොහේ දැයි අපි දනිමු. මෙරට ජාතික ව්‍යාපාරයේ ගමන්මග පිළිබඳව ද අපට දැනුමක් ඇත. අප ඒ දැනුම ලබාගන්නේ බටහිර ක්‍රිස්තියානි ප්‍රවාද ආශ්‍රයෙන් නො වෙයි. අපේ දැනුම අප විසින්ම සිංහල ථෙරවාද බෞද්ධ සංස්කෘතියට සාපේක්ෂව ගොඩනගා ගන්නා ලද්දකි. ඒ දැනුම බටහිර දේශපාලන විද්‍යාව යනුවෙන් ඉගැන්වෙන මගෝඩියට වඩා ශක්තිමත් පදනමක පිහිටා ඇති බව ජාතික හෙළ උරුමය සම්බන්ධයෙන් ඒ මගෝඩිකරුවන් හා අප ක්‍රියාකළ ආකාරයේ වෙනසින් හා කතාකළ දැයින් පැහැදිලි වෙයි.  අපි ඉතා ආඩම්බරයෙන් එක් කරුණක් සඳහන් කරමු. අද ලෝකයේ හොඳම ඥානවිභාගය (එපිස්ටමොලජි නැත්නම් තියරි ඔෆ් නොලේජ්) ඇත්තේ අපට ය. බටහිරයන් හා ඔවුන් අනුකරණය කරන හෙංචයියන් ඒ පිළිගන්නේ ද නැත් ද යන්න අපට ප්‍රශ්නයක් නො වෙයි. අපේ මිනුම් දඬු සකස්කිරීමට අපි ඔවුන්ට ඉඩ නො දෙමු.

අප ජාතික හෙළ උරුමය විවේචනය කෙළේ බටහිර කසිකබල් දේශපාලන ප්‍රවාදවල (මතවාද) පිහිටා නොව සිංහල බෞද්ධ සංස්කෘතිය හා සම්ප්‍රදාය මත පිහිටා ය. ජාතික ව්‍යාපාරයෙහි සිටින ඕල්කට් බෞද්ධයනට අප තේරුම් ගැනීමට නොහැකිවීම පුදුමයක් නො වෙයි. ඔවුහු ආගමින් බෞද්ධ වුව ද සංස්කෘතියෙන් ක්‍රිස්තියානි වෙති. ඇතැමුන්ට මට දුරකතනයෙන් කතාකර ඕල්කට් බෞද්ධයා යනු කවුදැයි දැනගැනීමට අවශ්‍ය විය. ඒ ඇත්තටම දැනගැනීමට නොවන බව මා නොදැන සිටියා නො වෙයි. ඇතැම් උපාසක උපාසිකාවන්ට මා පෙනුනේ දේවදත්තයකු ලෙස ය. එහෙත් මම ජාතික ව්‍යාපාරයට ගල් නො පෙරළුවෙමි. ගල් පෙරළුවෝ ඔවුහුම වූහ.

මෙරට ප්‍රබුද්ධයන්, උගතුන්, බුද්ධිමතුන් ලෙස බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයේ බලමහිමයෙන් වැජඹෙන, බටහිර තුට්ටු දෙකේ හා තුට්ටු බාගයේ මතවාද පුනරුච්චාරණය කරන බටහිර වතුර ටැංකිවල ඉබාගාතේ යන ටැංකි මැඩියන් මෙන් අපි ජාතික හෙළ උරුමයෙහි ආගම හා දේශපාලනය කලවංවීමෙහි වරදක් නො දුටුවෙමු. ආගම හා දේශපාලනය බටහිර රටවල මිශ්‍ර වී ඇති බව අපි දනිමු. හෙට අනිද්දා පැවැත්වෙන ඇමරිකන් ජනාධිපතිවරණය තීරණය වන්නේ ආගම හා සංස්කෘතිය මත මිස හුදු ආර්ථිකයක් මත නොවන බව අපි දනිමු. බටහිර ටැංකි මැඩියන් නො දැනසිටියාට පහළොස්වැනි සියවසෙන් පමණ පසුව බිහි වූ නවකතා කෙටිකතා හා සාහිත්‍යය ද ඇතුළු සමස්ත බටහිර දැනුම ක්‍රිස්තියානි බව ද අපි දනිමු. පසුගිය දා මියගිය ඩෙරීඩා ඊනියා විසංයෝජනයක් ගැන මැත දෙඩවී ය. එහෙත් ඔහුගේ ඊනියා විසංයෝජනයේ ද ඇත්තේ ක්‍රිස්තියානිය මිස අන් කිසිවක් නො වෙයි. ක්‍රිස්තියානි ඩෙරීඩා විසංයෝජනය කිරීම සිංහල ථෙරවාද බෞද්ධ සංස්කෘතියෙහි නිර්මානය කෙරුනු අපේ ඥානවිභාගය වූ නිර්මානාත්මක සාපේක්ෂතාවාදයට කජු කන්නාක් වැනි ය. බටහිර කිනම් දැනුමක් ගත්ත ද එහි ඇත්තේ ක්‍රිස්තියානිය ය. ආගම, සංස්කෘතිය, දේශපාලනය, සාහිත්‍යය, විද්‍යාව ආදී මේ සියල්ල එකිනෙකින් වෙන්වන්නේ බාහිරින් පමණකි. බටහිර රාජ්‍යය ආගමෙන් වෙන් වී ඇතැයි අපේ ශිෂ්‍යයන්ට උගන්වන දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්යවරුන් සිටිය

© Prof. Nalin De Silva

යුත්තේ කෞතුකාගාරවල මිස දේශන ශාලා තුළ නො වෙයි. ඒ ඒ රටෙහි ඒ දැනුම්, විද්‍යුම් ආදී සියල්ල එකට බැඳ තබන හුය වනුයේ අදාල චින්තනය ය. බටහිර ඒ සියල්ල බැඳ තබන්නේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙන් ය.

අපට ජාතික ව්‍යාපාරයක් අවශ්‍ය වන්නේ ප්‍රධාන වශයෙන් ම බටහිර ක්‍රිස්තියානි දේශපාලන සංස්කෘතික හා ආර්ථික ආධිපත්‍යයෙන් මිදීමට ය. එය ජාතික නිදහස් අරගලය හා බැඳෙයි. 1817 වෙල්ලස්සේ නිදහස් සටන ඇරඹි දා සිට අපි තවමත් බ්‍රිතානියට විරුද්ධව සටන් කරන්නෙමු. ඒ සටන අද සමස්ත බටහිර ආධිපත්‍යයෙන් නිදහස්වීමට කරන අරගලයක් වෙයි. ඒ අරගලයෙහි ප්‍රධානම අංගයක් වූයේ මතවාදීව බටහිර දැනුම් ආධිපත්‍යයෙන් මිදීම ය. අනගාරික ධර්මපාලතුමාගේ කාලයෙහි වුව ද මතවාදී ආධිපත්‍යයෙන් මිදීමට අපට නො හැකිවිය. එහෙත් අපට 1815න් පසුව පළමුවරට බටහිර ක්‍රිස්තියානි මතවාදී ආධිපත්‍යයෙන් මිදීමට හැකි විය. එහෙත් අවාසනාවකට ඒ මතවාදී ජයග්‍රහනය කොල්ලකෑමට පිරිසක් ඉදිරිපත් වී ව්‍යාජව ජාතික ව්‍යාපාරයට එක්වූහ. ජාතික හෙළ උරුමය වැනි පක්ෂයකට මෙරට ජාතික ව්‍යාපාරයේ ඉඩක් ඇති වී තිබුණි. අවස්ථාවාදය හා අවස්ථාවාදය පමණක් පෙරටුකරගත් මේ පිරිස අර මතවාදී ජයග්‍රහනය කොල්ලකමින් ඒ හිඩැස පිරවීමට ඉදිරිපත්වූහ. ඔවුන්ට සිංහල බෞද්ධ සංස්කෘතිය නොහඳුනන ඇතැම් ඕල්කට් බෞද්ධයන්ගේ ද සහාය ලැබිණි.

අප ජාතික හෙළ උරුමයට විරුද්ධ වූයේ ආගම හා දේශපාලනය මිශ්‍ර කිරීමට එරෙහි වූ නිසා නොව ඒ පක්ෂය සිංහල බෞද්ධ සංස්කෘතිය හා සම්ප්‍රදාය මත නිවැරදිව නොපිහිටි නිසා ය. සිංහල බෞද්ධ දේශපාලනයෙහි හරය හා භික්ෂූන් වහන්සේගේ කාර්යභාරය අවස්ථාවාදීහු විකෘති කළහ. අප නිරත විය යුත්තේ සිංහල බෞද්ධ දේශපාලනයක බව කීමට අපි බිය නො වෙමු. අප බිය විය යුත්තේ මුළුමනින් ම ක්‍රිස්තියානි දේශපාලනයක නිරතවන බුෂ් ට හා කෙරීට ද? එසේත් නැත්නම් ලූතරවාදී දේශපාලනයෙහි නිමග්න වූ සොල්හයිම්ට ද? එසේත් නැත්නම් ක්‍රිස්තියානි පල්ලිය විසින් හසුරුවනු ලබන ප්‍රභාකරන්ට ද? එසේ ද නොවේ නම් බටහිර ක්‍රිස්තියානි රටවල මුදලින් පුවත්පත් පළකරන, ඒ මුදලින් ලිප්ටන් වටරවුමේ හා කොටුව දුම්රිය පොළ ඉදිරිපිට නිරන්තරයෙන් පිකට්ටුවල යෙදෙන ප්‍රබුද්ධයන් නමින් පෙනී සිටින ඇට්කිච්චන් කිහිප දෙනකුට ද?

අවස්ථාවාදයට, සෝබනවාදයට ජාතික ව්‍යාපාරයෙහි ඉඩක් නැත. අද අපට ශක්තිමත් ජාතික ව්‍යාපාරයක් අවශ්‍ය වෙයි. මෙරට දේශපාලනයෙහි සිංහලත්වය අද සවිඥානික ව ක්‍රියාත්මක වෙයි. කිහිප ආකාරයකින් ම ජාතික හෙළ උරුමය අවස්ථාවාදී පිරිසකගේ අවශ්‍යතාව උඩ වුව ද මේ සවිඥානික තලයෙහි ක්‍රියාත්මක විය. බටහිර ක්‍රිස්තියානි පොතේ ගුරාලා, එනම් බටහිර මතවාද අනුකරනය කරන්නන්, කෙතරම් උත්සාහ ගත්තද මේ සවිඥානික බව ඉදිරියේ දී තව තවත් වර්ධනය වනු ඇත. ජාතික හෙළ උරුමය විසිරී යෑමෙන් එයට තිරිංග නොවැටෙනු ඇත. අද මතවාදී තලයෙහි ජයග්‍රහනය කර ඇත්තේ සිංහල බෞද්ධයන් බව කිසිවකුවත් අමතක නොකළ යුතු ය.

අද ආණ්ඩුවේ ද යම් ජාතිකත්වයක් ගොනුවෙමින් පවතියි. ඒ කුමාරතුංග මහත්මියට පිටින් බව අවධාරනය කළ යුතු ය. ජාතික හෙළ උරුමයේ ජාතිකත්වයක් ගැන අවංකව සිතන අය අද කළ යුත්තේ ආණ්ඩුවේ ගොනු වෙමින් පවත්නා ජාතිකත්ව වැඩපිළිවෙළ තව තවත් ශක්තිමත් කිරීම ය. ඉතා පැහැදිලිව ම ආණ්ඩුවේ කුමාරතුංග මහත්මියගේ විජාතික දේශපාලනය පරාජය කළ යුතු ය. අපට ජාතිවාදින්, උම්මන්තකයන් ආදී වශයෙන් බැණවදින, එහෙත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ඉවත් වී ඡන්ද දාහක් ගැනීමට නොහැකි ආණ්ඩුවේ සිටින බොරු මාක්ස්වාදීන් මහජන පාක්ෂිකයන් හා වෙනත් එවැන්නන් සන්ධානය තුළ පරාජය කිරීම අද දවසේ ජාතික ව්‍යාපාරයේ ප්‍රධාන කාර්යභාරය වෙයි. අද බටහිරයන් සූදානම් වන්නේ රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති කර ඔහු ලවා අන්තර්පාලනය ලබාදීම ය. එහෙත් ඉන්දියාව එයට විරුද්ධ වෙයි. පසුගිය දා රනිල් වික්‍රමසිංහ මහතා ඉන්දියාවට ගෙන්වා ගත්තේ ඒ බව ඔහුට පැවසීමට මිස දිල්ලි නගරය පෙන්වීමට නො වෙයි. එහෙත් ඉන්දියාව එසේ විරුද්ධවන්නේ ඉන්දියාවේ අවශ්‍යතාවයට මිස අපට ඇති ඇල්මක් නිසා නොවන බව අපි දනිමු. ප්‍රභාකරන් සමග ඊනියා සාම සාකච්ඡා අවශ්‍ය නො වෙයි. බුෂ් සදාම් හුසේන් සමග සාකච්ඡා පවත්වන දා අපි ද ප්‍රභාකරන් සමග සාකච්ඡා කරමු. අද ලෝකයේ විවිධ රටවලට අපේ නායකයන් යැයි කියන්නන් ගෙන්වා කළ යුත්තේ කුමක් දැයි පවසන්නේ ඒ ඊනියා නායකයන්ගේ නිවටකම නිසා ය. බුෂ් සොල්හයිම් චන්ද්‍රිකා රනිල් ප්‍රභාකරන් පරාජය කිරීම සඳහා සන්ධානයේ ජාතිකත්වය තහවුරු කළ යුතු වෙයි~